# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2474/47 – 2026 පෙබරවාරි මස 06 වැනි සිකුරාදා – 2026.02.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍යා බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 256-B, වෙලේගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හුණුපිටිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/KEL/2020/581 සහ 2021.06.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර ‘A’ – තලගහවත්ත – ප්‍රමාණය: **හෙක්. 0.3110**

උතුරට: ශ්‍රී ජයන්ති මාවත, මාර්ගය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ශ්‍රී ජයන්ති මාවතේ වරි. අංකය සොයාගත නොහැකි තලගහවත්ත; නැගෙනහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි ශ්‍රී ජයන්ති මාවතේ වරි. අංකය සොයාගත නොහැකි තලගහවත්ත සහ අරුන් ප්‍රශාන්ත් පදනම හිමිකම් කියන දුම්රියපළ පාරේ වරි. අංකය සොයාගත නොහැකි තලගහවත්ත; දකුණට: අරුන් ප්‍රශාන්ත් පදනම හිමිකම් කියන දුම්රියපළ පාරේ වරි. අංකය සොයාගත නොහැකි තලගහවත්ත සහ හුණුපිටිය දුම්රියපළ පාර; බටහිරට: හුණුපිටිය දුම්රියපළ පාර සහ ශ්‍රී ජයන්ති මාවත.

**කේ. ඩී. ලාල් කාන්ත,**  
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ  
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/19/2019/E/218.  
2025 සැප්තැම්බර් මස 11 වැනි දින,  
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,  
“මිහිකත මැදුර”, රජමල්වත්ත පාර,  
බත්තරමුල්ල.

EOG 02 – 0047



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*